# පඤ්ඤා පිළිබඳ පෙළෙහි එන ප්‍රස්තුතː සමාලෝචනාත්මක විශ්ලේෂණයක්

**වැලිවිට සොරත හිමි**

## හැඳින්වීම

සෑම දර්ශන ක්ෂේත්‍රයක ම අන්තර්ගත ප්‍රධාන අංග අතර ඥානය ප්‍රමුඛස්ථානයක් ගනී. ඒ පිළිබඳ වීමංසනය කෙරෙන දර්ශන ශාඛාව ඥානවිභාගය (Epistemology or Theory of Knowledge) වශයෙන් හඳුන්වනු ලබයි. 'ඤා' ධාතුවෙන් නිපන් 'ඤාණ' (දැනීම් අර්ථයෙන්) යන වචනයෙන් දැනීම, හැඳිනීම අවබෝධය, ඥානය, ප්‍රඥාව යන අර්ථ ප්‍රකාශ වෙයි **(බුද්ධදත්ත හිමි, 1998ː 212)**. මෙසේ ලැබෙන ඥානය හෙවත් දැනීම ඉතා වැදගත් වෙයි. මුල් කාලයේ ඥානය හා විශ්වාසය පිළිබඳ ව දාර්ශනිකයෝ සාකච්ඡා කළහ. ඒ බව ප්ලෝතනික (Platonic) මිනෝ සංවාදය, (**Guthsies, 1968: 05)**. භාරතීය ඡන්දෝග්‍ය උපනිෂදය වැනි ඉපැරණි දාර්ශනික කෘතීන්ගෙන් පෙනී යයි. මින්පසු ඥාන මාර්ගයේ වැදගත් ප්‍රස්තුතයක් වන ප්‍රත්‍යක්ෂය (Perception) හා ස්මෘතිය (Memory) වැනි කරුණුවල ඇති අගය ද දාර්ශනිකයන්ගේ විමර්ශනයට භාජනය වී තිබේ. ඥානය හෙවත් දැනීම පිළිබඳ විශේෂ ආකාර දනවන ප්‍රස්තුත ඇතැයි සමහර දාර්ශනිකයෝ කල්පනා කළහ. උදාහරණ වශයෙන් ''ඉමැනුවෙල් කාන්ට්'' නමැති දාර්ශනිකයාගේ නාමය මෙහිලා සඳහන් කළ හැකිය. ප්‍රාග් අනුභූතික වූ විශේෂ ඥානයක් ඉදිරිපත් කරන ''සංශ්ලේෂී'' නමැති ප්‍රස්තුත විශේෂයක් ඇති බව හෙතෙම කල්පනා කළේය. ඒ බව ඔහුගේ ''ශුද්ධ විචාරය පරීක්ෂාව'' කෘතියෙන් පෙනී යන බව සඳහන් වේ **(වීරසිංහ, (1991). 21-25)**. මෙසේ විවිධ විමර්ශනයන්ට භාජනය වූ ඥානය පිළිබඳ ව ආදි බුදුදහමෙහි පැනෙන ප්‍රස්තුතවල අගය අපමණය. ක්‍රි. පූ. හයවන සියවසේ පහළ වූ බුදුරජාණන් වහන්සේ විසින් බුදුදහමෙහි තාත්ත්වික ඥානය ලැබීමෙහි ලා වීමංසනයෙහි ඇති වැදගත්කම කාලාම හා වීමසංක වැනි සූත්‍රයන්ගෙන් මනාව

පැහැදිලි කර දෙයි (**අං.නි. 1, කාලාම සුත්තං, 1977: 244 හා ම.නි. 1, වීමංසක සුත්තං, 1977: 744).**

එසේම ඥානය හෙවත් ප්‍රඥාවම මුල්කරගෙන බුදුදහම පවතින බව බුදුරජුන්ගේ ම දේශනාවකින් පැහැදිලි වෙයි.

''බුදුදහම වනාහි ප්‍රඥාවන්තයින්ට මිස මෝඩයින්ට නොවේ.''

පඤ්ඤවතො අයං ධම්මො නායං ධම්මො දුප්පඤ්ඤස්සාති **(අං.නි. 5, අට්ඨකනිපාතය, 1977: 136).**

ඥානය පිළිබඳ ආදි බුදුදහමෙහි දක්වන ආකල්පයෙහි ඇති දාර්ශනික අගය මින් පැහැදිලි වෙයි. එසේම බුදුරජුන් අවබෝධ කරගත් ධර්මය මනා අවබෝධයක් ඇති පණ්ඩිතයන් විසින් ම දැනගතයුතු බව ප්‍රථමාභිසම්බෝධියේ දී ධර්මය මෙනෙහි කළ අවස්ථාවේ දී උන්වහන්සේට වැටහුණි.

ඉක්බිති හුදකලා වූ, පළසමවතින් යුක්ත වූ, භාග්‍යවතුන් වහන්සේට මෙබඳු කල්පනාවෙක් පහළ විය. මා විසින් අවබෝධ කළ මේ චතුරාර්ය සත්‍යය ගැඹුරුය. දැකීමට දුෂ්කරය. අවබෝධයට දුෂ්කරය. ශාන්තය. ප්‍රණීතය. තර්කයෙන් නොදත හැකිය. සියුම්ය. පණ්ඩිතයන් විසින් ම දත යුතුය.

අථ ඛො භගවතො රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි. අධිගතො ඛො ම්‍යායං ධම්මො ගම්භීරො දුද්දසො දුරනුබෝධො සන්තො පණීතො අතක්කාවචරො, නිපුණො, පණ්ඩිතවෙදනියො **(ම.ව. 1, මහාක්ඛන්ධකං, 1957: 10).**

බුදුදහමෙහි ඤාණ, පඤ්ඤා හා පරිඤ්ඤා වශයෙන් ඥානය හැඳින්වීම සඳහා පාරිභාෂික වචන තුනක් භාවිත කර ඇති බව ද සූත්‍ර දේශනාවලින් පෙනේ. 'ඤාණ' යන්න නුවණ, හැඳිනගැනීම, දැනගැනීම යන අරුත් දෙයි. 'පඤ්ඤා' යනු විශේෂ වූ දැනගැනීම නැතහොත් පිරිසිඳ දැකීම වශයෙනුත්, 'පරිඤ්ඤා' යන්නෙන් අවිද්‍යාව සිඳ බිඳ දමා විශේෂයෙන් දියුණු කරගනු ලබන ඥානය නම් වේ **(බුද්ධදත්ත හිමි, 1998: 212, 290, 317).**

**සාකච්ඡාව**

ඉහතින් සඳහන් කළ කරුණු අනුව බුදුරජුන් විසින් ප්‍රඥාව කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර ඇති බව පැහැදිලි වන නිසා එකී ඥානය හා ඒ පිළිබඳ පැනෙන ප්‍රස්තුත විමසා බැලීම මෙම ලිපියෙහි අරමුණ වේ.

**විවරණ**

''අපදාන සොභිනී පඤ්ඤා'' **(අං.නි. 1, තිකනිපාතය, 1977: 198).**

කෙනෙක් තම ශරීරය අලංකාර කිරීම සඳහා මාල, වළලු, කරාබු, ලස්සන ඇඳුම් ආදිය පළඳිති. සඳුන් කුංකුම ආදි නොයෙක් ආකාරයේ තවරන ආලේප කරති. මේ සියලු දෑ තුළින් ශරීරයේ තාවකාලික අලංකාරයක් දිස් වේ. එසේම චරිතවත් වීම සඳහා අන් අයගේ අවධානය ගනු පිණිස දානමාන, සිල් රැකීම්, භාවනා කිරීම් ආදි නොයෙක් ක්‍රියාවන් සිදු කරති. එහෙත් මේ කිසිදු දෙයකින් චරිතය ශෝභාමත් වන්නේ නැත. අනවශ්‍ය චරිතාංගවලින් බැහැරව කටයුතු කරන විට චරිතය ශෝභාමත් වේ. එවිට ඔහුගේ ප්‍රඥාව ද ශෝභාමත් වේ. ඒ සඳහා පුද්ගලයා නුවණින් යුක්තව කල්පනා කොට කටයුතු කළ යුතුය. බුදුරජුන්ගේ දේශනාවට අනුව 'චරිතය තුළින් ප්‍රඥාව ශෝභාමත් වේ.' ඒ සඳහා ඔහු කායදුශ්චරිත, වාග් දුශ්චරිත හා මනෝදුශ්චරිත යන අකුසලයන්ගෙන් ඈත් විය යුතුය. ප්‍රාණඝාතාදි අකුසල කර්මයන් සිදු කරන්නේ සිත, කය හා වචනය මුල්කරගෙනය. මෙයින් මිදී සුචරිත ක්‍රියාවන් සිදු කරන විට පුද්ගලයාගේ චරිතය ශෝභාමත් වේ. එය සදාචාර සම්පන්න ජීවිතයක් ගත කිරීමට හේතුවක් වේ. එසේම ප්‍රඥාව දියුණු කර ගැනීමට ද හේතුවක් වේ. චරිතය ශෝභාමත් නැති පුද්ගලයා යන යන තැන සිදු කරන්නේ තමන්ටත් අනුන්ටත් අවැඩදායක ක්‍රියාවන්ය. එවැනි ක්‍රියාවන් කරන තැනැත්තා බාලයෙකු ලෙසත්, එයින් අත්මිදී සුචරිත ක්‍රියා කරන්නා පණ්ඩිතයෙකු බවත් **අංගුත්තර නිකායේ** තිකනිපාතයේ දී බුදුරජුන් විසින් දේශනා කරන ලදි.

තීණිමානි භික්ඛවෙ බාලස්ස බාලලක්ඛණානි බාලනිමිත්තානි බාලාපදානි. කතමානි තීණි? ඉධ භික්ඛවෙ බාලො දුච්චින්තිතචින්තී

හොති, දුබ්භාසිතභාසී, දුක්කතකම්මකාරී. තීණිමානි භික්ඛවෙ පණ්ඩිතස්ස පණ්ඩිත ලක්ඛණානි පණ්ඩිතනිමිත්තානි පණ්ඩිතාපදානි. කතමානි තීණි? ඉධ භික්ඛවෙ පණ්ඩිතො සුචින්තිතචින්තී හොති, සුභාසිතභාසී, සුකතකම්මකාරී **(අං.නි. 1, තිකනිපාතය, 1977: 198).**

එසේම වරක් සොණදණ්ඩ බමුණා විසින් සීලය හා ප්‍රඥාව සම්බන්ධයෙන් කළ ප්‍රකාශය බුදුරජුන් අනුමත කළ අවස්ථාවක් සොණදණ්ඩ සූත්‍රයේ දී හමුවේ. සීලය පිරිසිදු වීම ප්‍රඥාවෙනුත් ප්‍රඥාව පිරිසිදු වීම සීලයෙනුත් සිදුවන බව එහිදී පෙන්වා දී තිබේ.

සෙය්‍යථාපි භො ගොතම හත්ථෙන වා පාදං ධොවෙය්‍ය, පාදෙන වා හත්ථං ධොවෙය්‍ය, එවමෙව ඛො භො ගොතම සීලපරිධොතා පඤ්ඤා, පඤ්ඤා පරිධොතා සීලං **(දී.නි., සොණදණ්ඩ සුත්තං, 1962: 242).**

මෙහි යහපත් ක්‍රියා වශයෙන් දක්වන්නේ සීලවන්තව කටයුතු කිරීමයි. ප්‍රාණඝාතාදි දස අකුසල්වල දැක්වෙන්නේ ඒවායින් විරමනය වීමයි. ඒ අනුව සෑම අතින් ම යහපත් ක්‍රියාවන් කරන පුද්ගලයාගේ චරිතය ප්‍රඥාවෙන් ශෝභාමත් වන අතර, එසේ නොකරන්නාගේ චරිතය දූෂිත වූවක් වන බව පැහැදිලි වේ.

''සුස්සූසා ලභතෙ පඤ්ඤං'' **(සං.නි. 1, යක්ඛසංයුක්තය, 1960: 382).**

වරක් ආළවක යක්ෂයාගේ විමනට වැඩි බුදුරජුන්ගෙන් ආළවක විමසන්නේ ප්‍රඥාව ලැබෙන්නේ කුමන කාරණයකින් ද යන වගයි. (කථංසු ලභතෙ පඤ්ඤං) එයට බුදුරජුන්ගේ පිළිතුර වූයේ 'මනාව ඇසීමෙන් ප්‍රඥාව ලැබේය' යන්නයි. අපගේ ශ්‍රවණයට යමක් ග්‍රහණය වන්නේ සෝත හෙවත් කණිනි. කණ ආධාරයෙන් ගන්නා විවිධ ශබ්ද පිළිබඳ මනා අවබෝධය ලබාගන්නේ සොත විඤ්ඤාණය මගිනි. සෝත හෙවත් කන ප්‍රකෘතියෙන් දක්නට ලැබෙන්නකි. ප්‍රකෘතියෙන් දක්නට ලැබෙන කනට විවිධ ශබ්ද ඇසේ. ඒවා අවධානයකින් යුක්තව සොත විඤ්ඤාණයට ගෙන සිතේ තැන්පත් වේ. ඒ අනුව කනට ඇසෙන ශබ්ද කණෙහි විඤ්ඤාණයෙන් ලබාගෙන සිතේ තැන්පත් වීමෙන් ප්‍රඥාව වැඩිදියුණු කරගත හැකිය. ගුරුවරයා කියන දේ කනින්

මැනවින් අසාගෙන සිටින විට එය කණෙහි විඤ්ඤාණය මගින් විශේෂයෙන් දැනගෙන යථාවබෝධය ගොඩ නැගේ. එසේම යමක් කටපාඩම් කරන විට, හඬ නඟා කියන විට ද එය ශ්‍රෝත ඉන්ද්‍රිය මගින් නැවත විඤ්ඤාණයට ඇතුල් කරවයි. එය ද ප්‍රඥාව වර්ධනය වීමට හේතුවක් වේ. ඒ අනුව මැනවින් ඇසීම ප්‍රඥාව දියුණු වීමට හේතුවක් වේ.

''පඤ්ඤා සුතවිනිච්ඡිනී'' **(ඛු.නි., මහාකප්පිනත්‍ථෙරගාථා, 1972: 156).**

සුස්සුසා ලභතෙ පඤ්ඤං යන්න හා සමාන කියමනක් මෙයින් ගම්‍ය වේ. ඇසූ දෙය විනිශ්චය කරන්නේ ප්‍රඥාව මාර්ග යෙනි. ලොව අසන්නට ලැබෙන දේ අතුරින් නිවැරදි, සුදුසු දෙය තෝරා බේරා ගැනීමට ඉවහල් වන්නේ ප්‍රඥාවයි. යම් පුද්ගලයෙක් ගමනක් යන විට හෝ යම් ක්‍රියාවක් සිදුකරන විට ඔහුට වටපිටින් ඇසෙන ශබ්ද බොහෝය. පරිසරයේ කුරුල්ලන්ගේ නාදය, කර්මාන්ත ශාලාවන්හි සිදු කරනු ලබන කටයුතුවල ශබ්ද, මිනිසුන්ගේ හඬ ආදි නොයෙක් ශබ්ද තරංග වා තලයට මුසු වේ. මේ සියල්ල අපගේ කණට ඇසුණත් ශ්‍රෝත ඉන්ද්‍රිය සම්බන්ධ සෝත විඤ්ඤාණය මගින් ගනු ලබන්නේ අපට අවශ්‍ය දේ පමණි. ඒ අනුව අප අසන දේ නිසියාකාරව විනිශ්චය කොට හොඳ නරක ගනු ලබන්නේ ප්‍රඥාවෙනි. වෛදික යුගයේ ශ්‍රැතියට මුල් තැන දෙමින් ප්‍රඥාව දියුණු කර ගැනීමට පුද්ගලයා වෙහෙසුන බව වෛදික සාහිත්‍යය දෙස බැලීමෙන් පෙනී යයි. **ඍග් යජුර් සාමන්** හා **අථර්වන්** යන චතුර්වේදය සජ්ඣායනා කිරීමෙන් ඉදිරියට පවත්වාගෙන ගිය බව බ්‍රාහ්මණ උපනිෂද් වැනි ග්‍රන්ථවලින් පැහැදිලි වේ. මේ ක්‍රමය ම බුදුදහමෙහි ද ඉදිරියට ආ බව පෙනේ. ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරන තෙක් භික්ෂූන් වහන්සේලා ධර්මය කටපාඩමින් රැගෙන ආවාහ.

''පඤ්ඤා කිත්ති සිලොක වඩ්ඪති'' **(ඛු.නි., මහාකප්පිනත්‍ථෙරගාථා, 1972: 156).**

ප්‍රඥාව කීර්ති ප්‍රශංසා වර්ධනය වීමට හේතු වේ. සියලු ආකාරයෙන් මිනිසාගේ බැබළීමට ප්‍රඥාව හේතු වන බව මින් කියවේ. මෙහි දැක්වෙන 'සිලොක' යන ශබ්දය වෛදිකයේ 'ශ්ලෝක' යන

පදයෙන් බිඳී ආවකි. එහි අර්ථය කීර්තිය යන්නයි. ඒ අනුව 'සිලෝක' යන්නෙන් කීර්තිය ගම්‍යමාන වන අතර 'අසිලොක' යන්නෙන් 'නින්දාව' 'අපකීර්තිය' යන තේරුම් දෙයි. ප්‍රඥාවන්තකම ලෝකයේ උසස්ම දේ වන බව කියවේ. ඒ අනුව ප්‍රඥාව යම් කෙනෙක් තුළ පවතින්නේ නම් ඔහු සියල්ලන්ගේ ම උසස් පුද්ගලයෙකු බවට පත් වේ. ප්‍රඥාවන්තකම පුද්ගලයාට ලැබෙන්නේ සීල ප්‍රතිපදාව තුළිනි. සීල ප්‍රතිපදාවේ නියුක්ත කෙනා කල්පනා කරන්නේ තමන් සතු සීලය පදනම් කරණකොටගෙන ප්‍රඥාවන්තයෙකු වන්නේ කෙසේද යනුවෙනි. කෙනෙකු තුළ සැමදාම සීලය තිබිය යුතුය. (සබ්බදා සීල සම්පන්නො) එසේ වූ පුද්ගලයා ප්‍රඥාවන්තයකු වී දැමුණු සිතැත්තෙක් වන්නේය. (පඤ්ඤවා සුසමාහිතො) ප්‍රඥාවන්ත පුද්ගලයා අරඹන ලද වීර්යය ඇත්තෙකි. නිවන කරාම යොමු වූ සිතැත්තෙකි. (ආරද්ධවිරියො පහිතත්තො) එසේ වූ ඔහු එතරමට අතිශයින් දුෂ්කර වූ කාම භව දිට්ඨි අවිජ්ජා වශයෙන් දක්වන චතුර් ඔඝයන් තරණය කරන්නෙක් වන්නේය. (ඔඝං තරති දුත්තරං)

ඒ අනුව කෙනෙකුගේ ප්‍රඥාව පදනම් කරගෙන කීර්ති ප්‍රශංසා ඇති වන බව මෙයින් කියවේ. කෙනක් අපකීර්තියට පත් වන්නේ සිදු කරනු ලබන අනුවණ ක්‍රියා හේතුවෙනි. එහෙත් ප්‍රඥාවන්ත පුද්ගලයා නිතර ම සිදුකරන්නේ තමාටත් අනුන්ටත් ප්‍රයෝජනවත් වන දේය. සමාජමය වශයෙන් සිදු කරන එම ක්‍රියා නිසා අන් අයගේ පැසසුමට භාජනය වෙයි. කීර්ති ප්‍රශංසා බලාපොරොත්තුවෙන් නොවුණත් සිදු කරනු ලබන නුවණැති ක්‍රියාවන් හේතුවෙන් නිතැතින් ම ඒවා ලැබේ. ප්‍රඥාවේ ඉහළට පත් බුදුරජාණන් වහන්සේ මෙන් ම රහතන් වහන්සේලා ද කීර්ති ප්‍රශංසා ලැබුවෝය. එවැනි තත්ත්වයක් ලබා ගත් මහාකප්පින තෙරුන් වහන්සේ තමන් ප්‍රඥාවේ උසස් ම තැන වන නිවන් අවබෝධය සාක්ෂාත් කර ගැනීමෙන් පසු මෙම ගාථා පාඨය කියමින් තමාගේ ප්‍රීති සොම්නස් බව ප්‍රකාශ කර තිබේ.

''පඤ්ඤා සහිතො නරො ඉධ අපි දුක්ඛෙසු සුඛානි වින්දති'' **(ඛු.නි., 5, මහාකප්පිනත්ථෙරගාථා, 1972: 156).**

බොහෝ දෙනෙක් කරදර බාධක පැමිණි කල්හි දුකට පත් වන්නේ ඒ පිළිබඳ නුවණින් කල්පනා කොට කටයුතු කිරීමට හැකියාවක් නොමැතිකම නිසාය. ගෘහ ජීවිතය ගත කරන අය පමණක් නොව පැවිදි

බව ලබාගත් අනගාරික ජීවිත ගතකරන ඇතැම් මහණුන් පවා මෙම තත්ත්වයට පත්වේ. කෙනෙකුට කරදර බාධක පැමිණෙන්නේ තමන් නොසිතන නොපතන අවස්ථාවක දී විය හැකිය. එවැනි අවස්ථාවන්හි දී ඒවාට මුහුණ දීමේ හැකියාව හැම කෙනාටම නොමැත. බුදුරජුන් බෝධිසත්ත්ව අවධියේ පටන්ම නොයෙක් කරදර බාධකවලට මුහුණ පෑ අයුරු ජාතක කථාවලින් පැහැදිලි වේ. එහෙත් ඒවාට නොබිය ම මුහුණ දෙමින් නුවණින් කල්පනා කොට නිසි ප්‍රතිකර්ම සිදු කර ඇත. ප්‍රඥා පාරමිතාව පූරණය කරන ලද්දේ එවැනි අවස්ථාවන්වල දී ය. ප්‍රඥාව දියුණු කර ගැනීම උදෙසා භාවනානුයෝගීව සිටි බුදුරජුන්ට මාරයා විවිධාකාරයෙන් කරදර බාධක ඇති කළේය. එහෙත් ඒවාට මැනවින් මුහුණු දුන්නේ ප්‍රඥාවෙන් යුක්ත වූ නිසාය.

ඒ අනුව ඉහත පාඨයෙන් පැහැදිලි වන්නේ ප්‍රඥාවන්ත මිනිසා දුක් කරදර බාධක පැමිණි ''පඤ්ඤා මෙ යුගනංගලං'' **(ඛු.නි., 5, කසීභාරද්වාජ සුත්තං, 1977: 24)**

කසීභාරද්වාජ බමුණා කුඹුරු වැඩ කරමින් ජීවිකාව ගෙන ගිය තැනැත්තෙකි. බුදුරජුන් කසීභාරද්වාජ බමුණාට අනුග්‍රහ පිණිස වැඩම කළ අවස්ථාවේ ''ශ්‍රමණය මම සී සාමි, වපුරමි, සී සා වපුරා ආහාර පිණිස ශස්‍ය සොයාගන්නෙමි. නුඹ ද එසේ කරන්න'' යැයි කීවේය. එවිට බුදුරජුන් තමන් වහන්සේ ද එසේ කොට ආහාර අනුභව කරන බව ප්‍රකාශ කළ සේක. බමුණු තෙමේ බුදුරජුන් ළඟ අවශ්‍ය කරන කිසිදු උපකරණයක් නොදැක ඒවා කොහිදැයි විමසයි. එවිට බුදුරජුන් ශ්‍රද්ධාව බීජ හැටියටත්, තපස වැස්ස හැටියටත්, ප්‍රඥාව වියගහ හා නඟුල වශයෙනුත් ගෙන සියලු උපකරණ තමන් සතුව ද ඇති බව දැක් වූ සේක. මෙහි ප්‍රඥාවට වියගහ හා නඟුල ම උපමා කර ඇත්තේ කුමක් නිසාද? වැපිරීමේ මුල්ම කාර්යය වන්නේ සී සෑමයි. සී සෑම සඳහා ගොනාට බැඳිය යුත්තේ වියගහ හා නඟුලයි. යම් ප්‍රධාන කාර්යයක් සිදුකිරීමට නම් ඊට අවශ්‍ය වන්නේ ශක්ති සම්පන්න බවයි. වියගහ හා නඟුල සීසෑමේ දී අවශ්‍ය ශක්ති සම්පන්න ද්‍රව්‍ය දෙකකි. ඒ දෙකම බුදුරජුන්ගේ ප්‍රඥාව යැයි දක්වා ඇත්තේ නිවන සාක්ෂාත් කර ගැනීමේ දී අවශ්‍ය ප්‍රධානතම දෙයකි ප්‍රඥාව. ප්‍රඥාව නොමැතිව ශ්‍රද්ධාව ද උපදවා ගත නොහැකිය. කෙනෙකුට ශ්‍රද්ධාව තිබුණත් ප්‍රඥාව නොමැතිනම් ප්‍රයෝජනයක් නොවන බව බොහෝ උදාහරණ

මගින් පැහැදිලි වේ. මෙහි විස්තර වන ප්‍රඥාව වනාහි විපස්සනා මාර්ග ප්‍රඥාවයි.

ප්‍රඥාවන්තයන් අතර අගතැන්පත් සැරියුත් මහ රහතන් වහන්සේ සමග වාද විවාද කළ බොහෝ දෙනා දමනය වූහ. සච්චක, ආලවක වැනි අය බුදුරජුන් සමග වාදයට පැමිණ පරාජය වූහ. වාසෙට්ඨ සෝණදණ්ඩ වැනි ශ්‍රමණ බ්‍රාහ්මණයන් බුදුරජුන්ගේ ධර්මය අසා පැවිදි වූහ. බුදුරජුන්ගෙන් බණ ඇසූ බොහෝ දෙනා අවසානයේ පැවිදි වූයේ ප්‍රඥාව දියුණු කරගත් නිසාය. බුදුරජුන්ගේ දේශනාවසානයේ බොහෝ දෙනා කීවේ එකම පාඨයකි.

යටිකුරු කර ඇති දෙයක් උඩුකුරු කොට පෙන්නුවා සේ, වැසුණු දෙයක් විවර කර පෙන්නුවා සේ, මංමුලා වූවෙකුට මග කියන්නා සේ, ඇස් ඇත්තෝ රූප දකිත්වායි යන හැඟීමෙන් බුදුරජුන් නොයෙක් ආකාරයෙන් ධර්මය දේශනා කළහ. අද පටන් දිවි ඇති තෙක් මම බුදුන් දහම් සඟුන් සරණ ගිය උපාසකයෙකු බවට පත්කරගන්න.

අභික්කන්තං භො ගොතම අභික්කන්තං භො ගොතම, නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති. එවමෙව භොතා ගොතමෙන අනෙක පරියායෙන ධම්මො පකාසිතො. එසාහං භවන්තං ගොතමං සරණං ගච්ඡාමි. ධම්මඤ්ච භික්ඛු සංඝඤ්ච. උපාසකං මං භවං ගොතමො ධාරෙතු. අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති. (බොහෝ සූත්‍රවල දැකිය හැකිය)

මෙහි මෙහි තෙල් පහන යනුවෙන් අදහස් වන්නේ ප්‍රඥාව හඳුන්වා දීම සඳහා යෙදුණ එකක් යැයි සිතිය හැකිය.

''පඤ්ඤා ලොකස්මිං පජ්ජොතො'' **(සං.නි. 1, දෙවතා සංයුත්තය, 1960: 82).**

වරක් දේවතාවෙක් රාත්‍රී භාගයේ බුදුරජුන් සමීපයට පැමිණ 'කිංසු ලෝකස්මිං පජ්ජොතො' යනාදි වශයෙන් ලෝකයේ පහනක් හෙවත් ආලෝකයක් වන්නේ කුමක්දැයි විමසූහ. ඊට පිළිතුරු වශයෙන්

බුදුරජුන් දැක්වූයේ 'පඤ්ඤා ලෝකස්මිං පජ්ජොතො' යනුවෙනි. නුවණ වනාහි ලෝකයේ පහන හෙවත් ආලෝකය වේය යන්නයි. නුවණ හා සමාන ආලෝකය විහිදුවන පහනක් ලොව නැති බව මෙයින් කියවේ. ඥානය ලොව අවිද්‍යා නැමති අන්ධකාරය නැසීමට හේතුවක් වේ. හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගන්නා වූ සියලු දේට මූලික හේතුව අවිද්‍යාවයි. ඒ අනුව පුද්ගලයාගේ දුක්ඛ, දෝමනස්ස ආදි සියල්ලක් ම හටගන්නේ අවිද්‍යාවෙන්ය. දුක, දුක හටගැනීම, දුක නැතිකිරීම, දුක නැති කිරීම හා දුක නැති කිරීමේ මාර්ගය යන චතුරාර්ය සත්‍යය අවබෝධය ලෙහෙසියෙන් කෙනෙකුට අවබෝධ කර ගත නොහැකිය. එය නොදන්නාකම නිසා සංසාරයේ භවයෙන් භවය සැරිසරනු ලබයි. එබැවින් ආර්ය සත්‍යාවබෝධය පිණිස නුවණ වැඩිය යුතුය. එබැවින් නුවණ වැඩූ පුද්ගලයා ප්‍රඥාව නැමති ආලෝකය විහිදුවන පහණක් බඳු යැයි කියා තිබේ. මේ හා සමාන හැඳින්වීමක් සංයුත්ත නිකායේ ම දක්නට ලැබේ.

''නත්ථි පඤ්ඤා සමා ආභා'' **(සං.නි. 1, දෙවතා සංයුත්තය, 1960: 12).**

ප්‍රඥාව සමාන ආලෝකයක් නැත්තේය. අවිද්‍යා අන්ධකාරයෙහි ගිලුණු මුළු මහත් ලෝකය ආලෝකවත් කරන ප්‍රඥාව හා සමාන කිසිවක් ලොව නැති බව මෙයින් ප්‍රකාශ වේ. උපන්නාවූ පුද්ගලයා තුළ ඇතිවන ප්‍රඥාව නැමති ඇස උපයෝගී කරගෙන තම ජීවිතය ආලෝකමත් කර ගත හැකිය. ජීවිතය වනාහි තාවකාලික වූවකි. සසර ඉපදීම යනු කරන ලද කුසලාකුසල කර්මයන්ගේ බලපෑම මත සිදු වන්නකි. නූගත් මෝඩ පුද්ගලයා කිසිවක් අවබෝධ කරගත නොහැකිව අයහපත් ක්‍රියාවන්හි නිරත වීමෙන් සසර දික් කරගනු ලැබේ. ප්‍රඥාවත් පුද්ගලයා සියල්ල හරිහැටි අවබෝධ කරගෙන කටයුතු කරන්නෙකි. මෙලොව වශයෙන් උපයාගන්නා වූ යම් ධන ධාන්‍ය ගේ දොර ඉඩකඩම් ආදිය තාවකාලිකය. මිනිසාගේ ජීවිතය ද තාවකාලිකය. මේ බව අවබෝධ කරගත් නුවණැත්තා, පණ්ඩිතයා තම ජීවිතයට ආලෝකයක් ඇති කර ගන්නේ ප්‍රඥාවෙනි. එබැවින් ප්‍රඥාව ආලෝකයක් යැයි දේශනා කර තිබේ.

''පඤ්ඤා ධනං චෙව බලං ච'' **(දී.නි. 3, සංගීති සුත්තං, 356).**

ප්‍රඥා තොමෝ ධනය ද බලය ද වේ. බොහෝ දෙනා ජීවත්වීම උදෙසා ධනය සොයනු ලැබේ. ධනෝපායන මාර්ගයන් බොහෝ සෙයින් තිබේ. ඒ අතරින් කළයුතු හා නොකළයුතු ධනෝපායන මාර්ග බුදුරජුන් විසින් දේශනා කර තිබේ. ජීවත්වීම උදෙසා එසේ ධනය සොයන්නේ නමුත් ප්‍රඥාව හා සමාන වූ ධනයක් මේ ලොව තුළ නොමැති බව ද පෙන්වා දී තිබේ.

තස්මාහි පඤ්ඤාව ධනෙන සෙය්‍යො යාය වොසානං ඉධාධිගච්ඡති.

මෙලොව යම් ප්‍රඥාවකින් ලෝකාන්ත සංඛ්‍යාත නිර්වාණය ලබා ද එහෙයින් ධනයට වඩා ප්‍රඥාව ද උතුම් වෙයි' **(ම.නි. 2, රට්ඨපාල සුත්තං, 1973: 440).**

එසේම බොහෝ ශක්තිවන්ත පුද්ගලයෝ ලෝකයේ වෙසෙති. ඔවුන් තමන්ගේ ශක්තිය උපයෝගි කරගෙන දුර්වලයාට ඕනෑම දෙයක් සිදු කිරීමට වෙහෙසෙයි. ශක්තිමත් බව පුද්ගලයාගේ දියුණුවේ සංකේතයක් නොවේ. ශක්තිය ඇත්තා ප්‍රඥාවෙන් තොර වූවෙක් නම් හේ නිතැතින්ම විනාශයට පත් වේ. ශත්කිය උපයෝගි කරගෙන කළයුත්තේ නොකළයුත්තේ කුමක්දැයි යන්න හරිහැටි අවබෝධ නොකිරීම ඊට හේතුවයි. එබැවින් බුදුදහමේ අවසන් ඵලය වන නිර්වාණය අවබෝධ කර ගැනීමට ප්‍රඥාව ශක්තියක් වේ.

කතමඤ්ච භික්ඛවෙ පඤ්ඤාබලං? ඉධ භික්ඛවේ අරියසාවකො පඤ්ඤවා හොති උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බේධිකාය සම්මා දුක්ඛක්ඛයගාමිනියා. ඉදං වුච්චති භික්ඛවෙ පඤ්ඤාබලං'' **(අං.නි., 3, පඤ්චක නිපාත, 1958: 232).**

මහණෙනි මේ සස්නෙහි ආර්ය ශ්‍රාවකයා මනාව දුක් ක්ෂය වීමට යන නිර්වේදය ඇසුරු කොට පවත්නා ස්කන්ධයන්ගේ පහළ වීමට හේතුවන දෑ මනාව දැනගැනීමට සමත් වූයේ ආර්ය ප්‍රඥාවෙන් සමන්නාගත වූයේ ද හේ ප්‍රඥාවත් පුද්ගලයෙක් වේ. මහණෙනි මෙය ප්‍රඥා බලය යැයි කියනු ලැබේ. යන දේශනාවෙන් ඒ බව මනාව පැහැදිලි වේ.

''පඤ්ඤා නරානං රතනං'' **(සං.නි., 1, දෙවතා සංයුත්ත, 1960: 66).**

වරක් එක්තරා දේවතාවෙක් බුදුරජුන් වෙත පැමිණ මිනිසුන්ට රත්නයක් වන්නේ කුමක්දැයි විමසූහ. (කිංසු නරානං රතනං) එවිට බුදුරජුන් දේශනා කළේ මිනිසුන්ට ප්‍රඥාව රත්නයක් වන බවය. ඒ අනුව ප්‍රඥාව හා සමාන කිසිම දෙයක් මුළු තුන් ලොව නැති බව ඉහත ප්‍රකාශයෙන් පැහැදිලි වේ. රත්න ශබ්දය ඉපැරණි වදනකි. ඍග් වේදාගත පළමුවන මන්ත්‍රයෙහි රත්න ශබ්දය විශේෂයෙන් යෙදී තිබේ. 'දීම්' අර්ථවත් වන 'රා' ධාතුවෙන් නිපන් මෙයින් ප්‍රදානය, පඬුර, ධනය, පොහොසත්කම පමණක් නොව මැණික, වස්තුව යන විවිධ අර්ථ ද ප්‍රකාශ වේ. ආදි බුදුසමය වනවිට 'රත්න' ශබ්දය 'මාහැඟි වස්තුව' යන අරුත් පල කරන වචනයක් විය. ඒ අනුව ත්‍රිවිධ රත්නය යන ඉගැන්වීම ද බිහිවිය. ''හේ කවර අර්ථයකින් රත්න නම් වන්නේද යත්? චක්‍රවර්තීහට ප්‍රාදුර්භූත වූ චක්‍රය ද ඉක්මවා සිටින බැවින් ද මහාර්ඝ වන බැවින් ද කිසි දෙයකට සමාන කළ නොහැකි නිසා ද දුර්ලභව ලැබිය යුතු දෙයක් නිසා ද රත්න නම් වේ. ප්‍රඥාව ද එසේම ලෙහෙසියෙන් ලබා ගත නොහැකි දෙයකි. එබැවින් මිනිසුන්ගේ මහාර්ඝ වූ වස්තුව, රත්නය නම් ප්‍රඥාවයි.

''පඤ්ඤාහි සෙට්ඨා කුසලා වදන්ති නක්ඛත්තරාජාරිව තාරකානං'' **(ඛු.නි., ජාතක පාළි, 1983: 182).**

තාරකාවන්ගේ රජු චන්ද්‍රයාය. චන්ද්‍රයාගේ එළිය නිසා තරුවල එළිය පෙනෙන්නේ නැත. එසේම කෙනෙකුට සිදුකරනු ලබන කුසලය නොපෙණුනත් සියලු කුසල ධර්මයන් වනාහි ප්‍රඥාව ශ්‍රේෂ්ඨ කර පවතින්නේය. මෝඩ, අඥාන, යහපත් අයහපත් ආදිය කිසිවක් නොදන්නා වූ පුද්ගලයා තුළ ප්‍රඥාවක් දැකිය නොහැක. එබැවින් ඇතැම් අඥාන පුද්ගලයන් සිදු කරනු ලබන්නේ අයහපත් ක්‍රියාවන්ය. රාගාදි කෙලෙස් ධර්මයන් ඇති පුද්ගලයන් තුළ ගොඩ නැගෙන්නේ අකුසල ක්‍රියාවන්ය. එවැනි පුද්ගලයන් කෙලෙස් ධර්මයන් පිළිබඳ සිතමින් කටයුතු කරනවා මිස කුසල ධර්මයන් සිදු කිරීම සඳහා වෙහෙසෙන්නේ නැත. ප්‍රඥාවන්තකම නොමැති වීම මීට හේතුවයි. එබැවින් යම් කෙනෙකුට ප්‍රඥාව පවතින්නේ නම් ඔහු ශ්‍රේෂ්ඨයෙක් ම වන්නේය.

ප්‍රඥාවන්ත ජීවිතය ගත කරන්නා සියලු ජීවීන් අතර ශ්‍රේෂ්ඨ පුද්ගලයෙක් වන බව බුදුදහමේ පෙන්වා දී තිබේ. ආළවක සූත්‍රයේ

දී ආළවක යක්ෂයා විසින් ''කථං ජීවිං ජීවිතමාහු සෙට්ඨං'' යනුවෙන් විමසා සිටි අවස්ථාවේ බුදුරජුන් විසින් ''පඤ්ඤා ජීවිං ජීවිතමාහු සෙට්ඨං'' **(සං,නි., 1, යක්ඛසංයුත්තය, 1960: 382).** යනුවෙන් දක්වා ජීවින් අතර ප්‍රඥාව ඇති තැනැත්තා ශ්‍රේෂ්ඨ වන බව පෙන්වා දී තිබේ.

''පඤ්ඤාය පරිසුජ්ඣති'' **(සං,නි., 1, යක්ඛසංයුත්තය, 1960: 382).**

අට්ඨකථා නිරුක්තියට අනුව මෙයින් කියවෙන්නේ අවිද්‍යාවෙන් තොරව චතුර් ඕඝයන් තරණය කොට ලබා ගන්නා වූ අරහත් තත්ත්වයයි. අර්හත් තත්ත්වය වනාහි සියලු කෙලෙස් ධර්මයන්ගෙන් විනිර්මුක්තව ලබන නිර්වාණයයි. සියලු කෙලෙස්වලින් තොරවූ පුද්ගලයා පාරිශුද්ධත්වයට පත් තැනැත්තෙකි. එය ලබා ගත යුත්තේ ප්‍රඥාවෙනි. ආළවක යක්ෂයා 'කථංසු පරිසුජ්ඣති' යනුවෙන් කළ විමසීමට 'පඤ්ඤාය පරිසුජ්ඣති' යනුවෙන් පිළිතුරු දී ඇත්තේ එබැවිනි.

''දුප්පඤ්ඤස්ස පුරිසපුග්ගලස්ස පඤ්ඤාසම්පදා හොති පරික්කමනාය'' **(ම.නි., 1, සල්ලේඛ සුත්තං, 1977: 104).**

නුවණක් නැති පුද්ගලයාට අවිද්‍යාවෙන් දුරුවීම සඳහා ප්‍රඥාව සම්පදාවක් වෙයි. මෙහි අවිද්‍යාව යනුවෙන් හැඳින්වෙන්නේ චතුරාර්ය සත්‍යාවබෝධයයි. චතුරාර්ය සත්‍යය නොදන්නා පුද්ගලයා සසර සැරිසරන්නෙකි. එබඳු අවිද්‍යාවෙන් විද්‍යා ඥානය ලබා ගැනීමට ඉවහල් වන්නේ ප්‍රඥාවයි. ප්‍රඥාව ලබාගැනීම නිවන් අවබෝධය පිණිස හේතු වෙයි. බුදුරජුන් නිවන් අවබෝධ කරගත්තේ ප්‍රඥාව දියුණු කරගැනීමෙනි. ලොව ඇති සියල්ල මැනවින් අවබෝධ කරගත් හෙයින් උන්වහන්සේට 'සම්මා සම්බුද්ධ' යන නාමය යෙදේ. සම්මා සම්බුද්ධත්වයට පත් වීමේ දී නොයෙක් දුෂ්කරතාවන්ට මුහුණු දීමට සිදු විය. මාරයන්ගේ සම්ප්‍රාප්තිය, තණ්හා, රතී, රගා යන මාර දූවරුන්ගේ පැමිණීම ආදිය ඉන් සමහරකි. මේ සියලු බාධක කෙරෙහි ප්‍රඥාවෙන් යුක්තව සිට කටයුතු කළ බැවින් උන්වහන්සේට නිවන් අවබෝධය ඇති කර ගැනීමට හැකි විය. එබැවින් ප්‍රඥා සම්පත්තිය නිවන් අවබෝධ කිරීමේ දී සම්පදාවක් බවට පත් වේ.

''පච්චය පරිග්ගහො පඤ්ඤා'' **(පටි.ම., මහාවග්ග, 1971: 222.)**

ප්‍රත්‍ය ධර්මයන් පිළිබඳ දැනුම ලබා ගැනීම ප්‍රඥාව නම් වේ. මෙහි ප්‍රත්‍ය යනුවෙන් හඳුන්වන්නේ හේතුප්‍රත්‍ය ධර්මයයි. එනම් පටිච්චසමුප්පාදයයි. පටිච්චසමුප්පාදය යනු බුදුදහමේ ඉගැන්වෙන කේන්ද්‍රීය ඉගැන්වීමකි. එය වටහා ගැනීම අතිශය දුෂ්කරය. බුදුරජුන් පුද්ගලයාගේ ඉපදීමට හේතු වන කාරණය සෙවීම සඳහා කල්ප ලක්‍ෂ හතරක් පාරමිතාවන් පූරණය කොට අවසානයේ මාර පරාජය කොට ඒ සියල්ලට පිළිතුරු සොයා ගත්තේය. මේ සංසාරයේ මිනිසා දුක් විඳිමින් සැරිසරන්නේ චතුරාර්ය සත්‍යය නොදන්නා කම නිසාය. එසේ වූ සත්ත්වයා සංඛාර යනුවෙන් දක්වන පින් පව් රැස් කරමින් සසර සැරිසරයි. අවසානයේ සියල්ල දැඩිව අල්වාගෙන මරණින් පසු නැවත භවයක් ලබයි. මේ පුද්ගලයාගේ සසර පැවැත්මයි. මෙය නැවැත්වීම හේතු ප්‍රත්‍ය ධර්මයන් මනාව වටහා ගැනීමයි. පටිච්චසමුප්පාදය වටහා ගැනීම ධර්මය දැනගැනීම වන බව බුදුරජුන් පෙන්වා දී තිබේ. ''යො ධම්මං පස්සති. සො පටිච්චසමුප්පාදං පස්සති. යො පටිච්චසමුප්පාදං පස්සති සො ධම්මං පස්සති.'' මෙයින් කියවෙන්නේ ධර්මය දැකීම පටිච්චසමුප්පාදය දැකීම බවත් පටිච්චසමුප්පාදය දැකීම ධර්මය දැකීම බවත්ය. එබඳු වූ ධර්මය දැකිය යුත්තේ ප්‍රඥාවෙනි. එබැවින් ප්‍රත්‍ය දැනගැනීම සඳහා ප්‍රඥාව අනිවාර්යයෙන් තිබිය යුතු බව මෙයින් කියවේ. බුදුන් පළමුවෙන් ධර්මයෙහි පිහිටිය යුතු ඥානයත් පසුව නිර්වාණ ඥානයත් ලබා ගත් බව දේශනා කරයි.

පුබ්බේ ඛො සුසීම, ධම්මට්ඨිති ඤාණං. පච්ඡා නිබ්බානෙ ඤාණන්ති'' **(සං.නි., 1, අභිසමය සංයුත්ත, 1960: 194)**. යන්නෙන් එය පැහැදිලි වේ.

''සමාදහනෙ පඤ්ඤා'' **(පටි.ම., මහාවග්ග, 1971: 342.)**

සිත එකඟ කිරීමෙහි ලා ප්‍රඥාව වැදගත් වේ. බුදුරජුන් ධර්මය දේශනා කිරීමෙන් බලාපොරොත්තු වූයේ මිනිසාගේ පරම සත්‍යය වන නිර්වාණය අවබෝධ කර ගැනීමයි. යම් කෙනෙක් තුළ නොයෙක් සිතුවිලි ගොඩ නැඟෙන්නේ නම් ඒ තුළින් ඔහුගේ සිත යොමු වන්නේ තමාට පාලනය කර ගැනීමට නොහැකි අරමුණු කරාය. අරමුණ වැරදි වූ විට පුද්ගලයා විසින් සිදු කරනු ලබන්නේ තමාට අහිතකර දේය. අහිතකර දේට සිත යොමු වීමෙන් සංසාර ගමන තවදුරටත් දීර්ඝ වේ.

''ආසවානං ඛයො පඤ්ඤාය සච්ඡිකරණියො'' **(දී.නි., 3, සංගීති සුත්තං, 1976: 384).**

ආශ්‍රවයන් ක්‍ෂය කිරීම පිණිස ප්‍රඥාව අත්‍යවශ්‍ය වේ. මීට හොඳම නිදසුනක් ලෙස පෙන්වා දිය හැක්කේ චුල්ලපන්ථක හිමියන්ගේ කථා පුවතයි. ඔහු තමාගේ සිත එකඟ කර ගත නොහැකිව දුන් ගාථාව මාස තුනක් තිස්සේ අභ්‍යාස කළත් එය කළ නොහැකි විය. අවසානයේ බුදුරජුන්ගේ එකම අභ්‍යාසයකින් වහා සිත එකලස් කර ගත්තේය. එයින් පසු ඔහු බවුන් වඩා රහත් විය. එබැවින් සිත එකලස් කර ගැනීමට යම් දෙයක් පිළිබඳ සිතීමේ ප්‍රඥාව තිබිය යුතුය. ප්‍රඥාවන්තයාට සිත පාලනය කිරීම පහසුය. නූගත් අඥාන පුද්ගලයා නිතර කල්පනා කරන්නේ තමන්ට බාහිර වශයෙන් පැමිණෙන්නා වූ බලපෑම පිළිබඳව පමණි. එම බලපෑම්වලට නිසි පිළිතුරු සොයා ගැනීම අනුවණයාට කළ නොහැකිය. තමන් කරන කියන දේ පවා නිවැරදි යයි කල්පනා කරයි. එසේ කරන දේ අයහපත් වූ දෙයක් වුවත් යහපත් දෙයක් යයි සිතා කටයුතු කරයි. එහෙත් ඉන් විපාක ලැබෙන විට අනුවණයා එම කළ කී දේ පිළිබඳව කම්පා වෙයි. සිත පාලනය කර නොගතහොත් ඉන් පුද්ගලයාට සිදුවන්නේ අයහපතකි. එබැවින් සිත දමනය කිරීමෙහි ලා ප්‍රඥාව අතිශයින් වැදගත් වෙයි. සමාධි භාවනාව තුළින් ලබන්නා වූ ප්‍රඥාව මහත්ඵල මහානිසංස වන බව බුදුරජුන් විසින් පෙන්වා දී තිබේ.

''සමාධි පරිභාවිතා පඤ්ඤා මහප්ඵලා හොති මහානිසංසා'' **(දී.නි., 2, මහාපරිනිබ්බාන සුත්තං, 1976: 126).**

එසේ මහත්ඵල මහානිසංස වූ ප්‍රඥාව වැඩීම යනු කාමාසව, භවාසව හා අවිජ්ජාසව යන සියලු ආශ්‍රවයන්ගෙන් විනිර්මුක්තව ලබන නිවන අවබෝධ කර ගැනීමයි.

''පඤ්ඤාපරිභාවිතං චිත්තං සම්මදෙව ආසවෙහි විමුච්චති, සෙය්‍යථීදං කාමාසවා භවාසවා අවිජ්ජාසවා'ති'' **(දී.නි., 2, මහාපරිනිබ්බාන සුත්තං, 1976: 126).**

''යත්ථ පඤ්ඤා තත්ථ සීලං'' **(දී.නි., 1, සොණදණ්ඩ සුත්තං, 1962: 242).**

යම් කෙනෙකුට ප්‍රඥාව තිබේ නම් එතැන සීලය ද වෙයි. සිල්වත් වූ පමණින් නිවන් දැකිය නොහැකිය. ඒ සඳහා වැඩි දියුණු

කරන ලද ප්‍රඥාව ද තිබිය යුතුය. සිල්වත් උපාසිකාවක් දිනක් මිදුල අතුගාමින් සිටිය දී භික්ෂූන් වහන්සේ නමක් පිඬු පිණිස වැඩියහ. තම අත රැදි මුසුන්න තබන්නට තැනක් සෙවූ මුත් හමු නොවූ විට භික්ෂූන් වහන්සේගේ සිරුරට හේත්තු කර වැන්දාය. ඇය සිල්වත් කමින් ශ්‍රද්ධාවෙන් සිටියත් ප්‍රඥාවෙන් තොර වූවාය. මේ හේතුව නිසා සිල්වත්කම හුදෙක් පුද්ගලයා සතු එක් දෙයක් පමණි. සිල්වත් කම ඇති තැන ප්‍රඥාව ද තිබිය යුතුය. ප්‍රඥාව ඇති තැන සිල්වත්කම නිතැතින් ම පිහිටන්නේය. මජ්ඣිම නිකායේ සොණදණ්ඩ සූත්‍රයේ දී සොණදණ්ඩ බමුණා විසින් ඉහතින් සඳහන් කළ පාඨයට අමතරව සීලය හා ප්‍රඥාව පිළිබඳ නොයෙක් ආකාරයෙන් කරුණු ඉදිරිපත් කරයි.

නො හිදං භො ගොතම, සීලපරිධොතා හි භො ගොතම පඤ්ඤා. පඤ්ඤාපරිධොතං සීලං, යත්ථ සීලං තත්ථ පඤ්ඤා. යත්ථ පඤ්ඤා තත්ථ සීලං. සීලවතො පඤ්ඤා. පඤ්ඤවතො සීලං. සීලපඤ්ඤාණං ච පන ලොකස්මිං අග්ගමක්ඛායති **(දී.නි., 1, සොණදණ්ඩ සුත්තං, 1962: 242).**

භවද් ගෞතමයෙනි, මෙය නොවේමය. භවද් ගෞතමයෙනි, ප්‍රඥාව සීලයෙන් පිරිසිදු වේ. ශීලය ප්‍රඥාවෙන් පිරිසිදු වේ. යම් තැනෙක සීලය වේ නම්, එහි ප්‍රඥාව ද වේ. යම් තැනෙක ප්‍රඥාව වේ නම් එහි සීලය වේ. සිල්වත්හට නුවණ වේ. ණුවණැත්තාට සිල් ඇති වේ. සීල ප්‍රඥා දෙක වූ කලී ලොව අග්‍ර යැයි කියනු ලැබේ.

ඉහත ප්‍රකාශය බුදුරජුන් විසින් ද අනුමත කර ඇති අතර, ඒ අනුව සීලය හා ප්‍රඥාව දෙක එකිනෙකට බැඳී පවතින බව ගම්‍ය වේ. ආදි බුදුසමය තුළ බොහෝ දෙනා බුදුන් කරා පැමිණියේ ප්‍රඥාවන්තයන් වශයෙනි. ඔවුහු පැමිණ තමන් සතු ප්‍රඥාව තවදුරටත් වර්ධනය කරගෙන නිවන් දැක්කාහ. ඔවුන් ප්‍රඥාවන්තයින් වූ නිසා බුදුරජුන් හමුවේදී අමුතුවෙන් සිල්වතුන් බවට පත්වීමට අවශ්‍ය නොවීය. අවශ්‍ය වූයේ ප්‍රඥාව වැඩි දියුණු කර ගැනීම පමණි. එබැවින් ප්‍රඥාව යම් කෙනෙකු තුළ පිහිටියේ නම් සීලය ද ඒ තුළ පිහිටන්නේය. එබඳු වූ ප්‍රඥාවෙන් යුත් සීලය ලොකයේ අග්‍ර, උසස් දෙයක් ලෙස පෙන්වා දී තිබේ. ''සීල පඤ්ඤාය පන ලොකස්මිං අග්ගමක්ඛායති''

**(දී.නි., 1, සොණදණ්ඩ සුත්තං, 1962: 242).** යන්නෙන් එය පැහැදිලි වේ. එසේම සීලය හා ප්‍රඥාව වඩන ලද පුද්ගලයා කාමය හා කෙලස් ධර්මයන්ගෙන් තොර වූ පුද්ගලයෙකුගේ තත්ත්වයට වැටේ. එනම් නිවන් දුටු තැනැත්තෙක් වන්නේය.

''පඤ්ඤාහි සමන්නාගතො පුග්ගලො පටිසම්භිදාප්පත්තො'' **(පටි.ම., මහාවග්ග, 1971: 384).**

ප්‍රඥාවෙන් යුක්ත වූ තැනැත්තා වනාහි පිළිසිඹියාවට පත් වූවෙකි. පිළිසිඹියා ගණන සතරකි. එනම් අර්ථ, ධර්ම, නිරුක්ති, ප්‍රතිභාන යනුවෙනි. මේ සතර අවබෝධ කර ගැනීම යනු රහත් තත්ත්වයට පත්වීමයි. ඉහතින් සඳහන් කළ ආකාරයට කෙනෙක් ප්‍රඥාව දියුණු කරගෙන සිටියේ නම් ඔහු නිවන් දුටු කෙනෙක් වන්නේය. නිවන් ලැබීම සියලු දෙනාට පහසු නැත. ඒ සඳහා උපතින් හෝ අභ්‍යාසයෙන් ලබන ප්‍රඥාව පමණක් ප්‍රමාණවත් නොවේ. ප්‍රඥාව තවදුරටත් දියුණු කිරීමෙන් ලබන අධිප්‍රඥාව ඒ සඳහා ලබා ගත යුතුය.

**සමෝධානය**

ඉහතින් සඳහන් කළ ''පඤ්ඤා'' යන ප්‍රස්තුතයට අනුව බුදුදහමේ ප්‍රඥාවට මුල් තැනක් ලැබී ඇති බව පෙනී යයි. පඤ්ඤා යන වචනයේ තේරුම එකක් වුවත් විවිධ අවස්ථාවන්වල දී බොහෝ කරුණු පැහැදිලි කර දීම සඳහා භාවිත කර ඇති බව කරන ලද විවරණවලින් පැහැදිලි වේ. ඒ අනුව බුදුදහම අනුගමනය කරන ප්‍රඥාවන්ත පුද්ගලයා වහා ධර්මය අවබෝධ කරගනී. බුදුරජුන් පෙන්වා දී ඇති අන්දමට බුද්ධත්වය, පසේ බුද්ධත්වය හෝ රහත් තත්ත්වය ලබා නිවන් දැකීමට ප්‍රඥාව පාරමිතාවක් වශයෙන් ද පිරිය යුතුය. මෙලොව ප්‍රඥාවන්ත පුද්ගලයෙකු වීම නිසා එය සසර පුරුද්දක් බවට පත් වී භවයෙන් භවය උපන් අවස්ථාවල දී ප්‍රඥාවන්තයෙකු වී ඉපදීමට ද එය හේතුවක් වේ. එබැවින් බුදුදහමේ පෙන්වා දෙන උසස් වූ ප්‍රස්තුතයක් ලෙස ප්‍රඥාව පෙන්වා දිය හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

### ප්‍රාථමික මූලාශ්‍රය

**අංගුත්තර නිකාය** 2, (1977). කොළඹ: බුද්ධජයන්ති ත්‍රිපිටක මුද්‍රණය.

**අංගුත්තර නිකාය** 3, (1958). කොළඹ: බුද්ධජයන්ති ත්‍රිපිටක මුද්‍රණය.

**අංගුත්තර නිකාය** 4, (1977). කොළඹ: බුද්ධජයන්ති ත්‍රිපිටක මුද්‍රණය.

**ඛුද්දක නිකාය,** ජාතක පාළි, (1983). කොළඹ: බුද්ධජයන්ති ත්‍රිපිටක මුද්‍රණය.

**ඛුද්දක නිකාය,** ථෙරගාථා පාළි, (1972). කොළඹ: බුද්ධජයන්ති ත්‍රිපිටක මුද්‍රණය.

**ඛුද්දක නිකාය,** පටිසම්භිදාමග්ග පාළි, (1971). කොළඹ: බුද්ධජයන්ති ත්‍රිපිටක මුද්‍රණය.

**ඛුද්දක නිකාය,** සුත්තනිපාත, (1977). කොළඹ: බුද්ධජයන්ති ත්‍රිපිටක මුද්‍රණය.

**දීඝනිකාය,** 1, (1962). කොළඹ: බුද්ධජයන්ති ත්‍රිපිටක මුද්‍රණය.

**දීඝනිකාය, 2,** (1976). කොළඹ: බුද්ධජයන්ති ත්‍රිපිටක මුද්‍රණය.

**දීඝනිකාය** 3, (1976). කොළඹ: බුද්ධජයන්ති ත්‍රිපිටක මුද්‍රණය.

**මජ්ඣිම නිකාය** 1, (1977). කොළඹ: බුද්ධජයන්ති ත්‍රිපිටක මුද්‍රණය.

**මජ්ඣිම නිකාය** 3, (1973). කොළඹ: බුද්ධජයන්ති ත්‍රිපිටක මුද්‍රණය.

**මහාවග්ග පාළි,** (1957). කොළඹ: බුද්ධජයන්ති ත්‍රිපිටක මුද්‍රණය.

**සංයුත්ත නිකාය** 1, (1960). කොළඹ: බුද්ධජයන්ති ත්‍රිපිටක මුද්‍රණය.

### ද්විතීයික මූලාශ්‍රය

බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, (1998). **පාලි සිංහල අකාරාදිය,** නැදිමාලා: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

වීරසිංහ, එස්. ජී. එම්., (1991). **කාන්ටියානු දර්ශනය,**

Guthsies, B., The Meno, (1968). **Penguin Classics.**